**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2017**

**----------------------------------------------**

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 10(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත අරමුදල් පනතේ 11 වගන්තිය ප්‍රකාර සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු එකී පනතේ 10(4) වගන්තියෙහි සඳහන් ආදායම් හා වියදම් ප්‍රකාශනය ඇමුණුම 01 ලෙසද, අරමුදලට අයත් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය ඇමුණුම 02 ලෙසද ඇතුළත්කර අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවසර දී ඇත්නම් මිස වත්කම් හා වගකීම් හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල නොදැක්විය යුතු වුවද, රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමකට අදාළ මුදල් පොත අනුව 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.5,739,535 ක බැර ශේෂය මුදල් හා මුදල් සමාන දෑ වල හර ශේෂයන්ගේ එකතුවෙන් අඩුකර මුදල් හා මුදල් සමාන දෑවල අගය රු.13,929,317 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3

විශේෂ ව්‍යාපෘති 8 ක් සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු මුදල්, භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් ලැබී තිබුණු පොලී ආදායම, එම පරිත්‍යාගශීලීන්ගේ ගිණුම් හා අරමුදල අතර විභජනයකර තිබුණද, එසේ විභජනය කළ පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවත්, ඊට පටහැනිව වත්කම මිලදීගත් දිනය සහ ඉවත් කිරීමේ දිනය නොසලකා මිලදී ගත් වර්ෂයට ක්ෂය නොකිරීමේ හා ඉවත් කළ වර්ෂය වෙනුවෙන් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් 2016 වර්ෂයේදී ලැබී තිබුණු රු.4,411,946 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ පොලී ආදායම 2016 වර්ෂයේදී ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එහි ඇතුළත් 2016 වර්ෂයට අදාළ පොලී ආදායම වූ රු.2,592,367 ක් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායමක් ලෙස යලි ගිණුම් ගත කර තිබීමත්, 2017 වර්ෂයට අදාළ පොලී ආදායම වූ රු.1,819,579 ක් 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ලැබුණු පොලී ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබීමත් හේතුවෙන් 2016 වර්ෂයේ පොලී ආදායම රු.4,411,946 කින් වැඩියෙන් දක්වා තිබුණි. එම වරද සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(ආ) 2017 හා 2018 වර්ෂ වෙනුවෙන් 2017 වර්ෂයේදී ලැබී තිබුණු රු.7,701,985 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ පොලී ආදායම 2017 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එහි ඇතුළත් 2017 වර්ෂයට අදාළ පොලී ආදායම වූ රු.2,387,390 ක් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායමක් ලෙස යලි ගිණුම් ගත කර තිබීමත්, එහි ඇතුළත් 2018 වර්ෂයට අදාළ පොලී ආදායම වූ රු.1,679,035 ක් 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ලැබුණු පොලී ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබීමේ හේතුවෙන් 2017 වර්ෂයේ පොලී ආදායම රු.4,066,425 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ස්ථාවර තැන්පත් පොලී ආදායම් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ පොලී ආදායම රු.2,080,742 ක් අඩුවෙන් හා වර්ෂය අවසානයට ලැබිය යුතු පොලී ආදායම් ගිණුම රු.61,471 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ) නව ආයුර්වේද නිෂ්පාදන 10 ක් විවෘත වෙළඳපොලට හඳුන්වාදීම හා ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත රු.මිලියන 15 ක මූල්‍යාධාරයක් අරමුදල විසින් ලබා දී තිබුණු අතර ඒ වෙනුවෙන් එම නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන ලාභයෙන් සියයට 10 ක් අරමුදල වෙත බැර කිරීමට එම සංස්ථාව එකඟ වී තිබුණි. ඒ අනුව 2017 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු ලාභ කොටස රු.266,748 ක් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා අක්ෂි බැංකුව විසින් සමාලෝචිත වර්ෂයේදී අපනයනය කර තිබුණු අක්ෂි පටල, පහළ ශ්‍රේණිගත කිරීමට හසුවීමෙන් සිදුවී තිබුණු රු.649,119 ක පාඩුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) 2017 ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු.275,076,121 ක් හා එදිනට පරිත්‍යාගශීලීන්ගේ ප්‍රදාන ගිණුමේ ශේෂය රු.550,586,924 ක් වෙන වෙනම දැක්වීම වෙනුවට ගිණුම් දෙකෙහි එකතුව රු.825,663,045 ක් සමුච්චිත අරමුදල් ගිණුමේ සටහන්කර තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 8 වන වගන්තිය | අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධානවලට යටත්ව අරමුදලට අයත් යම් මුදලක් ආයෝජනය කළ යුතු වුවද, අමාත්‍යවරයාගේ විධානයකින් තොරව අරමුදල විසින් 2017 දෙසැම්බර් 31 වන විට රු.403,639,949 ක් ස්ථාවර තැන්පතුවලද රු.496,352,400 ක් භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 264 (1) | සෑම ගෙවීමක් වෙනුවෙන්ම ආදායකයාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතු වුවද 2017 අගෝස්තු 24 දින පවත්වා තිබුණු රුධිර පරිත්‍යාග කිරීමේ කඳවුර වෙත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටපිරිස් සහභාගිවීම වෙනුවෙන් එම දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු රු.700,000 ක අත්තිකාරම වෙනුවෙන් කුවිතාන්සියක් ලබාගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ) | දෙන ලද තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිම වූ විගසම පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රජයේ රෝහල්වලට, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලට හා ජාතික රුධිර පාරවිලයන සේවයට අවස්ථා 9 කදී ලබා දී තිබුණු එකතුව රු.13,815,000ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාස 2 සිට මාස 8 දක්වා කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371 (5) | අතුරු අග්‍රිමයක ශේෂය කවර අන්දමකින් වුවද ආපසු භාරදීම එම අග්‍රිමය නිකුත්කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රජයේ රෝහල් 3 කට හා ජාතික රුධිර පාරවිලයන සේවය වෙත අවස්ථා 5 කදී ලබා දී තිබුණු රු.2,587,000 ක අතුරු අග්‍රිම 2018 ජනවාරි හා මාර්තු මාසවලදී පියවාගෙන තිබුණි. |
| (ඇ) 2015 මැයි 15 දිනැති අංක එම්එෆ්01/2015/01 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | විදේශ ගමන් සඳහා වැය වූ වියදම් ප්‍රතිපූරණය කිරීමට පෙර ගුවන් ගමන් විස්තරය, ගුවන් ප්‍රවේශ පත්‍රය හා ගමන් බලපත්‍රයේ පිටපතක් ආදී ලියවිලි මගින් වියදම්වල නිවැරදිතාවය සනාථ කරගත යුතු වුවද, එලෙස වියදම සනාථකර ගැනීමකින් තොරව ජිනීවා නුවර පැවති ප්‍රදර්ශනයකට සහභාගීවීම සඳහා වෛද්‍යවරයෙකු විසින් වැයකරන ලද රු.800,000 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.137,277,233 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.424,408,118 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.287,130,885 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ විවිධ ව්‍යාපෘති වියදම් රු.304,600,597 කින් වැඩිවීම හා ආදායම රු.17,469,713 ක් පමණක් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.46,900,783 ක ඌනතාවයක් වුවද, 2014 වර්ෂයේදී එය රු.49,171,867 ක අතිරික්තයක් බවට පත් වී තිබුණු අතර 2015 වර්ෂයේදී එම අතිරික්තය රු.6,443,292 ක් දක්වා අඩු වී තිබුණි. 2016 වර්ෂයේදී අතිරික්තය රු.424,408,118 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම අතිරික්තය රු.137,277,233 ක් දක්වා අඩු වී තිබුණි. තවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී අරමුදලේ දායකත්වය රු.45,800,448 ක සෘන අගයක් වූ අතර 2014 වර්ෂයේදී එය රු.50,804,915 ක ධන අගයක් දක්වා වර්ධනය වී තිබුණි. 2015 වර්ෂයේදී රු.8,333,801 ක් වූ දායකත්වය 2016 වර්ෂයේදී රු.426,527,547 ක් දක්වා වර්ධනය වී තිබුණද 2017 වර්ෂයේදී රු.139,490,978 ක් දක්වා අඩු වී තිබුණි.

ඒ ඒ වර්ෂවලදී නිශ්චිත කටයුතු සඳහා ලැබී තිබුණු පරිත්‍යාග හා වෙනත් ප්‍රදාන ඒ ඒ වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණද එම මුදල් ඒ ඒ වර්ෂය තුළදීම උපයෝජනය නොකිරීම නිසා මූල්‍ය ප්‍රතිඵලයේ ප්‍රමාණාත්මක විචලනයන් සිදු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

### 4.1.1 සැලසුම් කිරීම

1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනත ප්‍රකාරව අරමුදලේ අරමුණු හා කාර්යයන් ඉටුකරගැනීම වෙනුවෙන් හා අරමුදලේ පොදු අරමුදලට අයත් මුදලින් පනතේ 07 වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති කාර්යයන්ට අනුකූල වන පරිදි කාර්යසාධනය ළඟාකර ගැනීම සඳහා අරමුදල විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, අරමුදල ආරම්භයේ සිටම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

දිවයිනේ දුෂ්කර පළාත්වල සෞඛ්‍යාරක්ෂක සේවා සපයන ආයතනවල පවතින බොහෝ අඩුපාඩු අවමකර ගැනීම සඳහා අරමුදලේ සහාය ලබාගත හැකි බවට එම ආයතන දැනුවත් නොවීම හා දැනුවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් අරමුදලේ අරමුණු ප්‍රමාණවත් මට්ටමකින් ළඟාකර ගෙන නොතිබුණි. 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ එක් එක් වර්ෂවලදී අරමුදල සතු පොදු අරමුදලේ පැවති, වර්ෂය සඳහා උපයෝජනය කළ හැකිව තිබුණු අරමුදල් පිළිවෙලින් රු.276,654,645ක්, රු.261,124,443 ක්, රු.295,194,406 ක්, රු.358,057,285 ක් හා රු.387,348,583 ක් වූ අතර ඉන් පිළිවෙලින් සියයට 62 ක්, සියයට 79 ක්, සියයට 82 ක්, සියයට 77 ක් හා සියයට 72 ක් අරමුදලේ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර ආයතනයකට ණය ලබාදීමේ බලතල ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතෙන් ලැබී නොතිබුණු නමුත්, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත 2016 වර්ෂයේදී රු.මිලියන 10 ක පොලී රහිත ණය මුදලක් ලබාදී තිබුණි. ණය මුදල නිකුත් කළ දින සිට වර්ෂ 2 ක් ඇතුළත වාරික 24 කින් ණය අයකර අවසන් විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී අයවිය යුතු ණය වාරික 7 ක් එනම් රු.2,905,000 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) රිජ්වේ ආර්යා ළමා රෝහල සඳහා මහල් දහයකින් යුත් දැඩි සත්කාර ඒකකයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා "Little Hearts" නම් විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය, ළමා විශේෂඥවරුන්ගේ සංගමය හා අරමුදල විසින් 2017 පෙබරවාරි 17 දින අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණි. එදින සිට මේ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ගිණුමකට රු.මිලියන 214.5 ක අරමුදල් රැස්කර තිබුණු අතර 2017 වර්ෂය තුළදී ඉන් වැයකර තිබුණු මුදල රු.මිලියන 30 ක් විය. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) එළඹී තිබුණු අවබෝධතා ගිවිසුමේ අංක 3.15 හා අංක 3.16 ඡේදවල සඳහන් කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකයින් පත්කිරීම සම්බන්ධයෙන් වූ කොන්දේසි දෙක වෙනුවට ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාවට පැවරෙන ලෙසටත්, උපදේශක සේවාව මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය වෙත පැවරෙන ලෙසටත් අවබෝධතා ගිවිසුම සංශෝධනය කළ යුතු බවට 2017 අප්‍රේල් 05 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු නමුත් එපරිදි ගිවිසුම සංශෝධනයකර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධීකරණය වී ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාමට 2017 නොවැම්බර් 01 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණු නමුත් ව්‍යාපෘතියේ උපදේශක සේවාව සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය අතරත්, ඉදිකිරීම් කටයුතු සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා නාවික හමුදාව අතරත් අවබෝධතා ගිවිසුම්වලට එළඹී නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පිහිටුවීමට සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමග 2010 වර්ෂයේදී එළඹී තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 13/1172/509/052 සඳහා 2013 අගෝස්තු 29 දින ලැබී තිබුණු අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පනතක් මගින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් වශයෙන් ස්ථාපිත කළ යුතු අතර එහි ගණුදෙනු වාර්තා කිරීම සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් විගණන දිනය වූ 2018 අගෝස්තු 31 දින වන විටත් ඒ අනුව කටයුතු සිදු වී නොතිබුණි.

(ඈ) මීගහකිවුල රෝහලේ වාට්ටු සංකීර්ණය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු නියමිත දිනට හා නිසි ලෙස ඉටුකර නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන්කර තිබුණි. කොන්ත්‍රාත්තුව අවසන්කර වර්ෂ 7 කට වඩා වැඩි කාලයක් ගතව පැවතියද, එම කොන්ත්‍රාත්තුවට අදාළව රක්ෂණ සමාගමකින් අයකරගත යුතුව තිබුණු රු.1,372,346 ක කාර්යසාධන සුරක්ෂණය අයකර ගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (ආ) වගන්තියෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව උචිත ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව මිස කිසිම මුදලක් ආයෝජනය කරනු නොලැබිය යුතු වුවත්, එවැනි අනුමැතියක් ලබා ගැනීමකින් තොරව අරමුදල විසින් රජයේ බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක් 2016 ඔක්තෝබර් 18 දින සිට ආරම්භකර පවත්වා තිබුණි. එම බැංකුවේම පවත්වා තිබුණු ජංගම ගිණුමේ සෑම දිනකම ශේෂය රු.250,000 ක මට්ටමක තබාගැනීමට හා අතිරික්ත මුදල් පොලී ඉපයීමේ පරමාර්ථයෙන් ඉතිරි කිරීමේ ගිණුමට මාරුකර ගැනීම අරමුණ විය. නමුත් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 27 කදී ජංගම ගිණුමේ ශේෂය රු.250,000 ඉක්මවා තිබුණු අතර එම අවස්ථාවන්හිදී ගිණුමේ පැවති ශේෂය රු.303,404 සිට රු.42,750,000 දක්වා පරාසයක අගයන්ගෙන් යුක්ත විය.

(ආ) ජාතික ලේ බැංකුවට අත්‍යාවශ්‍ය ක්ෂණික මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා පමණක් අරමුදල් යෙදවිය යුතු අතර ඉන් පරිබාහිර කාර්යයන් සඳහා නොයෙදවිය යුතුය යන කොන්දේසියට එකඟව අරමුදල යටතේ 2001 වර්ෂයේදී ජාතික ලේ බැංකු සංවර්ධන අරමුදල පිහිටුවා තිබුණි. එහෙත් එම අරමුණට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ජාතික රුධිරදායක දිනය පැවැත්වීම සඳහා ජාතික ලේ බැංකු සංවර්ධන අරමුදලින් රු.3,985,114 ක් වැයකර තිබුණි.

(ඇ) ජාතික රුධිර පාරවිලයන සේවය සතු අතිරික්ත රුධිර ප්ලාස්මා, නම් කරන ලද ඉන්දියානු සමාගමක් වෙත මාස 06 ක කාලයක් සඳහා පමණක් විකිණීමටත් එම කාලපරිච්ඡේදය අවසානයේදී තරඟකාරී ලංසු කැඳවීම මගින් සුදුසු ගැණුම්කරුවෙකු තෝරාගත යුතු බවටත් 2015 අගෝස්තු 07 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී තිබුණි. ජාතික රුධිර පාරවිලයන සේවය විසින් 2016 හා 2017 වර්ෂයන්හිදී රුධිර ප්ලාස්මා ලීටර් 14,666.8 ක් විකුණා එයින් ලැබුණු රු.50,925,364 ක් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල යටතේ පවතින ජාතික ලේ බැංකු සංවර්ධන අරමුදලට බැරකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 අගෝස්තු 07 සිට මාස 6 ක කාලයක් සඳහා නම් කරන ලද ඉන්දියානු සමාගම වෙත රුධිර ප්ලාස්මා විකුණා නොතිබුණු අතර මාස 6 ක කාලසීමාවෙන් පසු තරඟකාරී ලංසු කැඳවීමේ පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2016 මාර්තු සිට 2016 ජූලි දක්වා කාලය තුළදී එම නම් කරන ලද සමාගමේ දේශීය නියෝජිත වෙත රුධිර ප්ලාස්මා ලීටර් 4,650.8 ක් රු.12,174,184 කට විකුණා තිබුණි. එම සමාගම තෝරාගත් ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) තරඟකාරී ලංසු කැඳවීම මගින් සුදුසු ගැණුම්කරුවෙකු තෝරාගත යුතු බවට 2015 අගෝස්තු 07 දින ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, තරඟකාරී ලංසු කැඳවීමේ පරිපාටියෙන් බැහැරවීමටත් සීමිත මිල කැඳවීම සිදුකර ගැණුම්කරුවෙකු තෝරාගැනීමටත් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017 ජනවාරි 19 දින අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේදී වෙනත් සමාගමක් වෙත රුධිර ප්ලාස්මා ලීටර් 10,016 ක් රු.38,751,180 කට විකුණා තිබුණි.

(iii) රුධිර ප්ලාස්මා විකිණීමෙන් උපයන මුදල් රාජ්‍ය ආදායමට බැරකළ යුතු වුවද එසේ නොකර ඒ වෙනුවට විධිමත් අධිකාරි බලයකින් තොරව අරමුදල යටතේ පවතින ජාතික ලේ බැංකු සංවර්ධන අරමුදල් ගිණුමට බැරකර තිබුණි.

(iv) රුධිර ප්ලාස්මා ගැණුම්කාර සමාගම වෙතින් ලබා ගෙන තිබුණු චෙක්පත් රුධිර පාරවිලයන සේවය නමින් ලබා නොගෙන ඒ වෙනුවට අරමුදල නමින් ලබා ගෙන තිබුණි.

(v) එම චෙක්පත් සඳහා නිකුත්කර තිබුණු කුවිතාන්සි රුධිර ප්ලාස්මා විකිණීමෙන් ලද මුදල් වෙනුවෙන් නිකුත් කළ යුතු වුවද, ඒ වෙනුවට රුධිර පාරවිලයන සේවයේ අවශ්‍යතා වෙනුවෙන් අරමුදල වෙත අදාළ සමාගම විසින් කරන ලද පරිත්‍යාග මුදලක් ලෙස හැඟවෙන ආකාරයෙන් කුවිතාන්සි නිකුත්කර තිබුණි.

(vi) 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 13 (4) වගන්තිය ප්‍රකාරව අරමුදල වෙත කරනු ලබන පරිත්‍යාග, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා එම පරිත්‍යාගයේ මුළු වටිනාකම වෙනුවෙන් බදු නිදහස් සහනය ලැබීමට ත්‍යාගදායකයා හිමිකම් ලබන හෙයින් මෙම ගණුදෙනු හේතුවෙන් රජයට හිමි විය යුතු බදු ආදායමද අහිමි වී තිබුණි. ඒ සඳහා අරමුදල එම සමාගම වෙත උදව් උපකාර කර තිබුණි.

(ඇ) අරමුදලේ අරමුණු හා කාර්යයන්ට ගැලපෙන පරිදි ආධාර ලබාදීමේ පදනමක් හා නිශ්චිත ප්‍රතිපත්තියක් පිළියෙල කර නොතිබුණි. අරමුදල විසින් විවිධ සංගම් හා ආයතන වෙත මූල්‍යාධාර සැපයීමේදී, සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 7 වගන්තියෙහි දක්වා ඇති කාර්යයන්හි විෂය පථය තුළට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් වන, උත්සව පැවැත්වීම සඳහා ශාලා ගාස්තු, සැරසිලි, විදේශ හා දේශීය ගමන් වියදම්, ප්‍රචාරණ වියදම්, ආහාර ද්‍රව්‍ය හා නවාතැන් සඳහා හෝටල් ගාස්තු වැනි වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ආධාර ලෙස රු.27,692,615 ක් ලබා දී තිබුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

නිශ්චිත කාර්යයන් 7 ක් සඳහා ලැබී තිබුණු රු.8,160,291 ක පරිත්‍යාග වර්ෂ 4 ත් වර්ෂ 30 ත් අතර කාලයක් එම අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝජනයකර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව අරමුදල විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.1.1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහරගම අපේක්ෂා රෝහල සඳහා Pet CT Scanner යන්ත්‍රයක් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කරවීම සඳහා වූ ප්‍රසම්පාදනය වෙනුවෙන් 2017 ජනවාරි 01 දින වන විට බාහිර පුද්ගල සංවිධානයක් හා එක්ව රු.302,235,122 ක මහජන අරමුදල් රැස්කර තිබුණු අතර 2018 මාර්තු 30 දින වන විට ඉන් රු.179,013,000 ක් වැයකර තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) Pet CT Scanner යන්ත්‍රය මිලදීගැනීම සඳහා බාහිර පුද්ගල සංවිධානයක් හා එක්ව මහජන අරමුදල් රැස්කිරීමටත් එම මුදල් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල නමින් බැංකුවේ තැන්පත් කිරීමටත් කටයුතුකර තිබුණද ඒ සඳහා ව්‍යාපෘති යෝජනාවක් පිළියෙල කිරීමට හෝ අදාළ සංවිධානය සමග අවබෝධතා ගිවිසුමකට එළඹීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ii) සැපයුම්කරු ලබා දී තිබුණු Pet CT Scanner යන්ත්‍රයේ Country Origin Certificate එක සහ වරාය හා බැංකුව වෙත ඉදිරිපත් කරන නිශ්කාශන ලියවිලි විගණනයට ඉදිරිපත් නොකළ හෙයින් සපයා තිබුණු යන්ත්‍රය ඇමරිකා එක්සත් ජනපදයේ අදාළ මව් සමාගමේ නව නිෂ්පාදනයක්ද යන බව විගණනයට තහවුරු නොකෙරුණි.

(iii) සැපයුම්කරු විසින් ඉදිරිපත්කර තිබුණු ඉන්වොයිසියට අනුව රු.36,314,377 ක්වූ දේශීය ගාස්තු අයකරමින් ලබාදීමට නියමිත අමතර උපාංග මොනවාද යන්න හා ඒවා යන්ත්‍රය සමග ලැබී ඇතිද යන්න තහවුරු කරගත හැකි ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iv) 2018 අප්‍රේල් 01 දින යන්ත්‍රය මහජනතාවට විවෘතව තිබුණද පිරිවිතර අංක 9.1 හා 9.2 ප්‍රකාරව, 2018 සැප්තැම්බර් 20 වන විටත් අදාළ නිලධාරීන් වෙත යන්ත්‍රය පිළිබඳව අදාළ පුහුණුවීම් ලබාදීමේ කටයුතු නිම වී නොතිබීම හේතුවෙන් Pet Scan ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව විසින් අක්ෂි පරිත්‍යාගශීලීන්ගෙන් ලබාගන්නා කුණික පටලවල ගුණාත්මකභාවය පරීක්ෂාකර වර්ග කිරීම සඳහා භාවිතා කරනු ලබන Specular Microscope උපකරණයක් මිලදී ගැනීම සඳහා අරමුදල යටතේ පවතින ශ්‍රී ලංකා අක්ෂි බැංකුව ගිණුමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.6,657,713 ක් වැයකර තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඖෂධ, වෛද්‍ය උපාංග හා උපකරණ ප්‍රසම්පාදනය කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසුකරු ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී උපකරණ සඳහා මෙන්ම එය ආනයනය කිරීම සඳහාද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ලබාගෙන තිබිය යුතු වුවත්, මෙම ලංසු කැඳවීමේදී එම අවශ්‍යතාවය නොසලකා හැර තිබුණි.

(ii) ප්‍රසම්පාදන අස්ථිත්වයේ අවශ්‍යතාවයට අනුව පිරිවිතර හා ලංසු ලේඛන කෙටුම්පත් පිළියෙල කර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව "අක්ෂි බැංකුව සඳහා කුණික පටල පරීක්ෂා කිරීමේ අරමුණ" වෙනුවෙන් උපකරණය ප්‍රසම්පාදනය කරන බව ලංසු ආරාධනාවේ හා ලංසු ලේඛනවල දැක්විය යුතු වුවද එසේ දක්වා නොතිබීමෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, නිශ්චිතව සඳහන්කර ඇති උපකරණවලට සමාන ලක්ෂණ ඇති උපකරණ හා සාරානුකූලව අවම වශයෙන් සමාන කාර්යසාධනයක් සලසන භාණ්ඩ සඳහා අර්පනයක් භාරගැනීමට පිරිවිතර මගින් අවසර ලබාදීමේ අවශ්‍යතාවයෙන් බැහැර වී තිබුණි.

(iii) සම්මත ලංසු කැඳවීමේ ලේඛන භාවිතා නොකරන්නේ නම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව, භාවිතා කරන වෙනත් සියලු ලේඛන පිළිවෙලින් තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂාකර අනුමත කළ යුතු වුවද ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයන්ගෙන් නියමිත ආකෘති පත්‍රයෙහි රහස්‍යතාවය පිළිබඳ ප්‍රකාශයන් අත්සන් කරවා ගැනීම සිදුකර නොතිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදන ක්‍රම තෝරාගැනීමේදී දේශීය සැපයුම්කරුවන්ගේ හැකියාව සීමාසහිත වන විට හා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම වාසිදායක වන විට ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම් කළ යුතු වුවද මෙම ප්‍රසම්පාදනය සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා නොතිබුණි.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසුව ප්‍රතිග්‍රහනය කිරීමෙන් පසු විධිමත් ප්‍රතිග්‍රහන ලිපියක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තෝරාගත් ලංසුකරු වෙත නිකුත්කිරීමටත් ඒ සමගම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීමටත් කටයුතු කළ යුතු වුවද, ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කිරීමට හා ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, සපයන ලද උපකරණය පිරිවිතර හා අනෙකුත් එකඟ වූ නියමයන්ට අනුකූල බව, වගකීම් සහතික, සුරක්ෂණ සහතික, අත්පොත් හා නඩත්තු සේවා පිළිබඳ එකඟතාවයන්වලට අනුකූල බවට සහතිකයක් ස්ථානභාර නිලධාරී විසින් නිකුත්කළ යුතු වුවද, එවැනි සහතිකයක් නිකුත් කර නොතිබුණි.

(viii) පිරිවිතරයට අනුව උපාංග කට්ටල (Supporting Equipment, මෘදුකාංග, ආරක්ෂිත යතුරු, LED Monitor, PC, Keyboard, Mouse) සැපයිය යුතු වුවද, ඉන්වොයිසියේ ඒවායේ වටිනාකම සඳහන්ව නොතිබුණු අතර, භාණ්ඩ ලැබීම් පත්වල (GRN) එම උපාංග ලැබුණු බවට සඳහන්කර නොතිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මඩුල්ල ප්‍රාදේශීය රෝහලේ වෛද්‍ය නිල නිවාස 2 ක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අරමුදල විසින් රු.9,801,584 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි. මේ පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත ප්‍රකාරව, රු.මිලියන 5 කට වැඩි කොන්ත්‍රාත් සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත්කරුවන් විසින් තමාද ඒ පොදු කොන්ත්‍රාත් ගිවිසුමද රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි විය යුතු වුවද, මුළු පිරිවැය රු.9,801,584 ක් වූ මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත්කරුවන් හා එම කොන්ත්‍රාත් ගිවිසුම් ලියාපදිංචි කර නොතිබුණි.

(ii) මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා) විසින් මඩුල්ල ප්‍රාදේශීය රෝහලේ නිරීක්ෂණ චාරිකාවක යෙදීමෙන් පසු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 2014 සැප්තැම්බර් 14 දින ඉදිරිපත්කර තිබුණු වාර්තාවකට අනුව, මෙම රෝහල සඳහා අවශ්‍ය වනුයේ එක් නිල නිවාසයක් පමණක් වුවද නිල නිවාස 2 ක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුදල් වැයකර තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අරමුදලේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අරමුදල් කළමනාකරණය | (i) පොදු අරමුදල සතු අරමුදල් උපයෝජනය කිරීමේ ප්‍රවණතාවය වර්ධනය කරගෙන නොතිබීම.<br>(ii) නිශ්චිත කාර්යයන් සඳහා ලැබෙන මුදල් අදාළ කාර්යය වෙනුවෙන්ම යොදා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | ප්‍රසම්පාදනයන් හා කොන්ත්‍රාත් පාලනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර නොතිබීම. |

**<u>ඇමුණුම 01</u>**

**<u>ආදායම් හා වියදම් ප්‍රකාශනය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි දක්වා ඇත.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | **2017** | | **2016** | |
| | රු. | රු. | රු. | රු. |
| ආදායම | | | | |
| ජාතික සම්පත ලොතරැයි ආදායම | 48,480,128 | | 69,611,040 | |
| පරිත්‍යාග | 464,555,483 | | 430,643,474 | |
| ආයෝජන පොලී | 85,613,849 | | 50,513,772 | |
| අනිකුත් ආදායම් | 40,373,759 | | 70,785,220 | |
| | | 639,023,219 | | 621,553,506 |
| වියදම | | | | |
| පරිපාලන වියදම් | 3,524,610 | | 2,925,352 | |
| මූල්‍ය වියදම් | 480,019 | | 145,302 | |
| සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් | 497,741,357 | | 194,074,734 | |
| | | (501,745,986) | | (197,145,388) |
| අතිරික්තය | | 137,277,233 | | 424,408,118 |

**ඇමුණුම 02**

**ආයෝජන ප්‍රකාශනය**

| බැංකුව | සහතිකයේ / බිල්පත්‍රයේ අංකය | ආයෝජනය අලුත් කල දිනය | ආයෝජන කාලය | 2017ජනවාරි 01 දිනට ශේෂය | 2017වර්ෂය තුළ ආයෝජනය කිරීම් | 2017වර්ෂය තුළ ආපසු ගැනීම් | 2017දෙසැ. 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| ---------- | ---------------- | --------- | ------- | -------------- | -------------- | ---------- | -------------- |
| | | | | රු. | රු. | රු. | රු. |
| මහජන බැංකුව ස්ථාවර තැන්පත් දඹුල්ල ශාඛාව | 13860156415 | 2017/09/30 | මාස 06 | 23,000,000 | - | - | 23,000,000 |
| | 13860156406 | 2017/09/30 | මාස 06 | 15,000,000 | - | - | 15,000,000 |
| | 13860137749 | 2017/10/08 | මාස 06 | 1,500,000 | - | - | 1,500,000 |
| | 13860156424 | 2017/09/30 | මාස 06 | 20,000,000 | - | - | 20,000,000 |
| | 13860156371 | 2017/09/30 | මාස 06 | 50,000,000 | - | - | 50,000,000 |
| | 13860156399 | 2017/09/30 | මාස 06 | 35,000,000 | - | - | 35,000,000 |
| ලංකා බැංකුව ස්ථාවර තැන්පත් මෙට්‍රොපොලිටන් ශාඛාව | 78651737 | 2017/11/15 | මාස 03 | 50,000,000 | - | - | 50,000,000 |
| | 78638673 | 2017/08/10 | මාස 06 | 20,000,000 | - | - | 20,000,000 |
| | 78862661 | 2017/12/04 | මාස 03 | 42,728,226 | - | - | 47,639,949 |
| | 78965346 | 2016/09/19 | | - | - | 10,419,671 | - |
| | 778651776 (Eye Bank) | 2017/11/15 | මාස 03 | 19,000,000 | - | - | 19,000,000 |
| මහජන බැංකුව පුරහල ශාඛාව | 16760168380 | 2017/09/29 | මාස 06 | - | 122,500,000 | - | 122,500,000 |
| | | | | | | | **403,639,949** |
| ලංකා බැංකුව භාණ්ඩාගාර බිල්පත් මෙට්‍රොපොලිටන් ශාඛාව | 16609 | 2017/12/22 | දින 182 | - | - | - | 4,804,230 |
| | 11310 | 2017/09/01 | දින 182 | - | - | - | 28,701,270 |
| | 11032 | 2017/08/25 | දින 182 | - | - | - | 47,846,900 |
| | 1372458 | 2017/12/29 | දින 07 | - | - | - | 155,000,000 |
| | 1370414 | 2017/12/22 | දින 14 | - | - | - | 160,000,000 |
| | 1372457 | 2017/12/29 | දින 32 | - | - | - | 100,000,000 |
| | | | | | | | **496,352,400** |
| | | | | | | | **899,992,349** |